## ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය - 2018

------------------------------------------------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මාණ්ඩලික විද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මාණ්ඩලික විද්‍යාලයේ ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මාණ්ඩලික විද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මාණ්ඩලික විද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මාණ්ඩලික විද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මාණ්ඩලික විද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| ගිණුම්කරණ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කරන විටක, එම වත්කම අයත්වන දේපල පිරියත හා උපකරණ පන්තිය මුලුමනින්ම ප්‍රත්‍යාගණනය කල යුතු වුවත් වාහන, ලිබඩු උපකරණ හා පරිගණක හා උපාංග යන වත්කම් පන්ති පිළිබඳ ප්‍රත්‍යාගණනයේදී තෝරාගත් වත්කම් කිහිපයක් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර අනෙකුත් වත්කම් 2018 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | 2018 සැප්තැම්බර් සිට තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකරන අතර වාර්තාව ලැබුණු පසු අවසන් ගිණුම්වලට ගැලපීම් සිදුකිරීමට නියමිතය. | ගිණුම්කරණ ප්‍රමිතින් වලට අනුකූල වන පරිදි අදාල වත්කම් පන්තියම එකවර ප්‍රත්‍යාගණනය කිරීමට උපදෙස් ලබාදිය යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛනය අනුව ක්ෂය අඩුකල පසු මාණ්ඩලික විද්‍යාලයේ මුළු ස්ථාවර වත්කම් වටිනාකම රු.1,349,210,943 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව එම අගය රු.1,336,590,911 ලෙස දක්වා තිබුණි. | 2018 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණ ලේඛණයේ සිදුකල වෙනස්කම් නිවැරදිව යාවත්කාලීන නොවීම වෙනසට හේතු වී ඇත. | ස්ථාවර වත්කම් ලේඛන නිවැරදිව යාවත්කාලීනව පවත්වා ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) 2010 – 2017 කාලපරිච්ඡේදය සඳහා වූ එකතුව රු.1,639,200 ක විගණන ගාස්තු සම්බන්ධයෙන් ගිණුම්වල ප්‍රතිපාදනයන් සිදුකර හෝ අදාල ගාස්තු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු විගණන ගාස්තු පිළිබඳ 2019 ජනවාරි 05 දින වන විටත් තොරතුරු ලැබී නොතිබුණු අතර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ එකගත්වය ලද පසු ගෙවීම් සිදු කරන බව. | වර්ෂය අවසානය දින වන විට නිරවුල් කළ යුතු වියදම් තක්සේරු කර ගිණුම් වලට ඇතුළත් කිරීමෙන් මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි බව තහවුරු වේ. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ගෙවිය යුතු මුදල්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මාණ්ඩලික විද්‍යාලය විසින් ශ්‍රී ලංකා යුධ හමුදාවට ගෙවිය යුතු වසර පහකට වැඩි කාලයක සිට පවතින රු.10,992,853 ක ණය ශේෂය පියවීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්වලින් කපා හැරීමට අවශ්‍ය අනුමැතිය ඉල්ලා ඇත. | දිගුකාලීන ණයශේෂ පියවීමට කටයුතු කිරීම අවශ්‍ය වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මාණ්ඩලික විද්‍යාලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 6,492,910 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.4,667,249 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,825,661 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව වියදම රු.4,540,447 කින් අඩුවී තිබුණද ආදායම රු.7,270,512 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී ,2015 වර්ෂයේදී හැර 2012 - 2018 දක්වා කාලය තුල මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයන් දක්නට ලැබුණු අතර එය වාර්ෂිකව උච්චාවචනය වී තිබුණි.කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු මාණ්ඩලික විද්‍යාලයේ දායකත්වය 2012 වර්ෂයේ රු.21,327,028 ක් වූ අතර එම අගය 2018 වර්ෂය වන විට රු.40,341,225 ක් දක්වා ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදන කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මාණ්ඩලික විද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය තුල ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 විධිවිධානයට වලට පටහැනිව ඡායා පිටපත් යන්ත්‍රයක්, කුඩාරම්, ගොඩනැඟිලි ද්‍රව්‍ය යනාදී ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා රු.6,619,998 ක මුදලක් හා මෝටර් රථ අළුත් වැඩියා, විදුලි උපකරණ අළුත් වැඩියා වැනි පුනරාවර්තන වියදම් සඳහා රු.11,617,870 ක මුදලක් විද්‍යාල ආයතන සභාපතිගේ ගිණුම මගින් දරා පසුව ප්‍රතිපූරණය කර තිබුණි. | විද්‍යාලයීය ආයතන සභාපති ගිණුම මගින් වැය දරා ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත භාණ්ඩ මිලදී ගෙන ඇත්තේ වඩා උසස් තත්ත්වයෙන් හා ප්‍රමිතයෙන් යුතු භාණ්ඩ මිලදී ගැනීම සඳහා සහ වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් වෙතින් අඩු මිලට භාණ්ඩ මිලදී ගැනීම සඳහා වේ. තවද, ණය පදනම මත ලබානොදෙන බැවින් විද්‍යාලයේ සියලුම නිලයන්ගේ සුභසාධන කටයුතු සඳහා විද්‍යාලය වෙතින් ප්‍රතිපූර්ණ කිරීමේ පදනම මත භාණ්ඩ මිලදී ගෙන ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමෙන් ආයතනික ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සිදුකිරීමට කටයුතු කිරීම අවශ්‍ය වේ. |

### 3.2 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2011 වර්ෂයේදී විද්‍යාලය වෙත පවරා තිබුණු ජාතික තරුණ සේවා සභාවට අයත් හෙයියන්තුඩුව ප්‍රදේශයේ පිහිටි ඉඩම් අක්කර 11 ක් සහ විද්‍යාලයේ කටයුතු සඳහා යොදාගනු ලබන ආරක්ෂක අමාත්‍යාංශයට අයත් ප්‍රත්‍යාගණන වටිනාකම රු.2,100,000 ක් වූ බස්රථය හා ශ්‍රී ලංකා යුධ හමුදාව වෙතින් ලබාදී තිබුණු පිරිවැය රු.19,875,000 ක් වූ වෙනත් වාහන 13 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් මාණ්ඩලික විද්‍යාලය වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි | ජාතික තරුණ සේවා සභාවට අයත් හෙයියන්තුඩුව වත්ත විද්‍යාලයට පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී. | විද්‍යාලයට අයත් භූමියේ අයිතිය තහවුරු කර වටිනාකම තක්සේරු කිරීම හා ආරක්ෂක අමාත්‍යාංශයට හා යුධ හමුදාවට අයත් වාහන විද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2008 අංක 5 දරන ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාල පනත ප්‍රකාරව, සන්නද්ධ හමුදාවල නිලධාරීන්ට පත්වීම් සහ උසස්වීම සඳහා ඔවුන්ට අවශ්‍ය වෘත්තීය දැනුම ලබාදීම හා මාණ්ඩලික විද්‍යාලයේ පුහුණුව ලබන නිලධරයින්ට අණ හා මාණ්ඩලික කර්තව්‍ය යන අවස්ථා දෙකෙහිම ඵලදායීව ක්‍රියාකිරීම සඳහා සූදානම් කිරීම විද්‍යාලයේ මූලික අරමුණ වේ. සමාලෝචිත වර්ෂයේදී විද්‍යාලය විසින් පවත්වා තිබුණු උපාධි පාඨමාලාව ශිෂ්‍යයන් 140 දෙනෙකු සම්පූර්ණ කර තිබුණු අතර එක් ශිෂ්‍යයෙකු වෙනුවෙන් රු.2,671,433 ක පිරිවැයක් දරා තිබුණි. තවද, පනත ප්‍රකාරව මාණ්ඩලික විද්‍යාලයේ කාර්යක්ෂමව ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍යවන මහාචාර්ය පදවි, ආචාර්ය පදවි හා වෙනත් තනතුරු ඇති කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක්ම අධ්‍යයන කාර්ය මාණ්ඩලයේ එම උසස් තනතුරු සඳහා පත්කිරීම සිදුකර නොතිබුණි. එසේම විද්‍යාලය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු සහ පරිපාලන නිලධාරිවරයෙකු පත්කර නොතිබුණි. | ගණකාධිකාරී අභ්‍යන්තර විගණක හා සිවිල් පරිපාලන නිලධාරී තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් පත්කර දෙන ලෙස අවස්ථා ගණනාවකදීම ඉල්ලුම්කර ඇත. මෙම තනතුරු සඳහා ඍජුව බඳවා ගැනීමට හැකි වන පරිදි මෙම විද්‍යාලයීය පනත සංශෝධනය කිරීම මේ වන විට සිදුකරමින් පවතී. | විශ්ව විද්‍යාලයේ අරමුණු මානව සම්පත සංවර්ධනය කිරීම වන හෙයින් උපාධි පාඨමාලාවේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගෙන පවත්වා ගෙන යාම අවශ්‍ය වේ. |

## 4. අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මාණ්ඩලික විද්‍යාලයේ කටයුතු සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තුව මගින් සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.399,111,000 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට ඉන් රු.36,264,272 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළ සිදුකළ ගනුදෙනුවලින් 2018 දෙසැම්බර් 31 දිනට රු.42,309,616 මුදලක් සඳහා බැරකම් වශයෙන් නිරවුල් කළ යුතුව පැවතුණි. | පුනරාවර්තන වියදම් සඳහා ලබාදුන් ප්‍රතිපාදනයට වඩා බැරකම් වලට බැඳී නොමැති අතර උපචිත වියදම් ගිණුම්වල ඇතුලත් කල පසු මෙම ප්‍රතිපාදන මුදල ඉක්මවා වැය දැරීමක් විය.<br><br>පුස්තකාල හා විභාගශාලා සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීමේදී සිදුව ඇති කොන්ත්‍රාත් විචලනය හේතුවෙන් මෙලෙස රු.5,959,010 ක ප්‍රතිපාදන ඉක්මවා වැය දරා ඇත. | මු.රෙ.94 අනුව වාර්ෂික ඇස්තමේන්තු වල ප්‍රතිපාදන ඇත්නම් මිස කිසිදු වියදමකට හෝ බැඳීමකට නොබැඳී සිටිය යුතුය. |